මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல் ஆணைக்குழு
Election Commission
මැතිවරණ මහලේකම් කාර්යාලය, අංක 02 සරණ මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව
தேர்தல்கள் செயலகம், இல.02 சரண மாவத்தை, இராஜகிரிய, இலங்கை
Elections Secretariat, No.02 Serana Mawatha, Rajagiriya, Sri Lanka

මාධ්‍ය නිවේදනය
ஊடக அறிவித்தல்
MEDIA RELEASE

මාධ්‍ය නිවේදන අංක : **2026/03**　　　　**2026.02.10**

# ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනය - 2026

2026 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධන ක්‍රියාවලිය මේ වන විට ආරම්භ කර ඇති අතර මෙම වර්ෂයේ දී ග්‍රාම නිලධාරීවරුන් නිවෙස් වෙත නොපැමිණෙන අතර 2025 ඡන්දහිමි නාමලේඛනයේ ඉවත්වන හා 2026 වර්ෂයට ඇතුළත් කිරීමට හිමිකම් ලබන නම් ඇසුරින් ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනය සිදු කෙරේ.

යම් තැනැත්තෙකුගේ නම 2025 ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි වී ඇත්නම් 2026 වර්ෂය සඳහාද 2025 ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචිව සිටින ලිපිනය යටතේ ලියාපදිංචි කිරීම සඳහා ක්‍රියා කරනු ඇති අතර ඔවුන් විසින් කිසිදු ආකෘතියක් සම්පූර්ණ කිරීමේ අවශ්‍යතාවක් නොමැත. එසේම 2025 වර්ෂයේ ලියාපදිංචි වී නොමැති හෝ වයස අවුරුදු 18 සම්පූර්ණ වීම මත ප්‍රථම වරට ඡන්ද හිමියෙකු ලෙස ලියාපදිංචි වන්නේ නම් හෝ 2026 වර්ෂයේ ලියාපදිංචි ලිපිනය වෙනස් කළ යුතු වන්නේ නම් හෝ 2026 වර්ෂයේ ඡන්ද හිමියෙකු ලෙස ලියාපදිංචි වීම සඳහා 2026/ER ආකෘති පත්‍රයක් සම්පූර්ණ කර ග්‍රාම නිලධාරී වෙත භාර දිය යුතු ය.

තවද පුරවැසියන් හට www.elections.gov.lk වෙබ් අඩවිය හරහාද ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි වීම සඳහා මාර්ගගතව ඉල්ලුම් කිරීමට අවස්ථාව සළසා ඇත.

2025 වර්ෂය සඳහා ඡන්ද හිමියෙකු ලෙස ලියාපදිංචි වී ඇත්දැයි යන්න ග්‍රාම නිලධාරී කාර්යාලවලින් හා දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවලින් මෙන්ම ec.lk/vrd සබැඳිය මඟින් සහ මෙම දැන්වීමෙහි ඇති පහත QR කේතය පරිලෝකනය (Scan) කිරීමෙන් පරීක්ෂා කළ හැකිය.

**ඡන්දහිමියන්ගේ දින වැඩසටහන හා මැතිවරණ ඉ - සේවා**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සහතික කර ඇති ජනතා පරමාධිපත්‍යයට අදාළ සර්වජන ඡන්ද බලය පිළිබඳව ජනතාව දැනුම්වත් කිරීමේ අරමුණින් 2026.02.01 දිනට යෙදෙන ඡන්දහිමියන්ගේ දිනයට සමගාමීව ඡන්දහිමියන්ගේ දින සැමරුම් වැඩසටහන් පෙබරවාරි හා මාර්තු මස තුළ දිවයිනේ සියලු දිස්ත්‍රික් ආවරණය වන පරිදි සංවිධානය කර ඇත. මෙම වසරේ ඡන්දහිමියන්ගේ දිනයේ තේමාව වනුයේ,

“ඩිජිටල් සහභාගීත්වය තුළින් ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කරමු” යන්නයි.

මෙම තේමාව මඟින් මැතිවරණ කොමිෂන් සභාව විසින් පහසුකම් සලසා ඇති පහත ඩිජිටල් සේවා පිළිබඳ පුළුල් ලෙස ජනතාව දැනුම්වත් කිරීමට අපේක්ෂා කරනු ලැබේ.

- ඡන්දහිමි ලියාපදිංචි තොරතුරු පරීක්ෂා කිරීමේ සේවාව;
- ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචිය සඳහා මාර්ගගතව ඉල්ලුම් කිරීමේ ඉ - සේවාව;
- යොවුන් පුරවැසියන් ලියාපදිංචිය සඳහා මාර්ගගතව ඉල්ලුම් කිරීමේ ඉ - සේවාව;
- 2015 වර්ෂයේ සිට ඉදිරියට ඡන්දහිමි නාමලේඛන තොරතුරු ඇතුළත් සහතිකයක් ලබා දීමේ ඉ - සේවාව;
- ආබාධ සහිත පුරවැසියන්ට ඡන්දහිමි පහසුකම් සැලසීම - ආබාධ සහිත පුද්ගලයින්ගේ ද්වාරය;
- ගෘහයේ පදිංචි සියලු අයගේ තොරතුරු ලබාගත හැකි ගෘහ මූලික ද්වාරය; වේ.

ඉහත සඳහන් සියලු ඉ - සේවාවන් වෙත https://eservices.elections.gov.lk යන සබැඳිය ඔස්සේ පිවිසිය හැකි අතර මෙම ඉ - සේවා සඳහා පුරවැසියන්ගේ ධනාත්මක ප්‍රතිචාර ලැබෙන අතර පසුගිය වර්ෂය තුළ දී මැතිවරණ ඉ - සේවාවන් තුළින් ලක්ෂ 80ක පමණ පිරිසකට සේවාවන් සපයා ඇත.

2026 ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනය හා මැතිවරණ කොමිෂන් සභාව විසින් ජනතාව වෙත ලබාදී ඇති සේවාවන් පිළිබඳව මාධ්‍ය ආයතනවලින් පුළුල් ප්‍රචාරයක් ලබාදෙනු ඇතැයි වැඩිදුරටත් අපේක්ෂා කරනු ලැබේ.

**ආර්.එම්.ඒ.එල්. රත්නායක**
**සභාපති/මැතිවරණ කොමිෂන් සභාව**
**(මැතිවරණ කොමිෂන් සභාව වෙනුවෙනි)**